# විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## 1. නර්තන ඩිප්ලෝමා පාඨමාලාව - 2023/2024
## (Diploma in Dance) - 2023/2024)

**පාඨමාලා කාලය** :- අවුරුදු 01 කි.

**සුදුසුකම්** :- ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් විෂයයන් 03 කින් සමත්වී තිබීම.

සහ

අ.පො.ස. (සා.පෙළ) හෝ අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් නර්තන විෂයය සමත්වී තිබීම.

සහ

විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීම.

**මාධ්‍ය** :- සිංහල

**පාඨමාලා ගාස්තුව** රු.110,000/ - (වාරික 03 කින් ගෙවීම් කළ හැක.)
(පළමු වාරිකය රු.60,000/- කි. දෙවන හා තෙවන වාරික රු.25,000.00/- බැගින්)

**දේශන** :- ලිඛිත හා ප්‍රායෝගික දේශන **සති අන්තයේ පෙ.ව. 8.00 සිට ප.ව.4.00 දක්වා** විශ්වවිද්‍යාලයේ අනුමත ක්‍රමවේද යටතේ පැවැත්වේ.

❖ මාර්ගගත ක්‍රමයට (online) අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථම පහත ලේඛනවල මුල් පිටපත් scan කොට (PDF documents) සකස්කර ගත යුතුය.
1. ජාතික හැඳුනුම්පතෙහි දෙපස පැහැදිලි ඡායාරූප (Images)
2. උප්පැන්න සහතිකයෙහි දෙපස පැහැදිලි ඡායාරූප (Images)
3. අයදුම්පත් ගාස්තු ගෙවා ලබා ගන්නා ලද වවුචරයේ පැහැදිලි ඡායාරූපයක් (Image)
4. මෙම පාඨමාලාවේ සුදුසුකම් වලට අදාළ ලේඛන වල **<u>පමණක්</u>** පැහැදිලි ඡායාරූප (Images)

**ඉහත ලේඛන හා සහතිකවල මුල් පිටපත් ප්‍රායෝගික පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු වේ.**

❖ මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් ගාස්තු ලෙස අයකරනු ලබන රු. 1,500/- ක මුදල සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ජංගම ගිණුම් අංක **71876640** දරණ ගිණුමට බැරවන සේ ඕනෑම ලංකා බැංකු ශාඛාවක **<u>කවුන්ටරය මගින් පමණක්</u>** බැර කර ලබාගන්නා ලද කුවිතාන්සිය මාර්ගගත ක්‍රමයට (online) අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උඩුගත (Upload) කළ යුතුය.

නැතහොත්

විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය **<u>www.vpa.ac.lk</u>** හි Pay Online හරහා ගෙවීම් කරන්නේ නම් රු. 1545.00 ක මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස ගෙවීම් කර ලබා ගන්නා ලදුපත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උඩුගත (Upload) කළ යුතුය.

❖ **අයදුම්පත් යොමු කළ යුතු ආකාරය :-** අයදුම්කරුවන් සබැඳිය ඔස්සේ පමණක් මාර්ගගත ක්‍රමයට(online) අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

❖ මෙම පාඨමාලාවට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් මෙන්ම අයදුම් කළ හැකි අවසන් දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **ගෙවන ලද ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.**

❖ අයදුම්කළ හැකි අවසන් දිනය **2023.06.21** වේ.


විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
දුරකථන අංකඃ **0112854584 / 0112828450 / 0112854549**
**Hotline : 0714958993 / 0714323623**
E-mail codl@vpa.ac.lk